කාර්ය සාධන චාර්තාව

2011



අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

අන්තර්ගතය

	පිටු අංකය
හැඳින්වීම හා පසුබිම් තොරතුරු	1
දැක්ම හා මෙහෙවර	2
සංවිධාන ව්‍යුහය හා පරිපාලනය	3 4
ආයතන ශාඛාව	5 7
සංවර්ධන අංශය	8 16
තොරතුරු තාක්ෂණ ඒකකය	16
නිෂ්පාදන අංශය	17 18
ප්‍රකාශන අංශය	19
බෙදාහැරීමේ අංශය	20 22
මුද්‍රණ අංශය	23 25
2011 ප්‍රගතිය නිරූපණය කරන දර්ශක	26 29
නව පිවිසුම්	30
සාරාංශය	31 32

ඇමුණුම්

1. පෙළපොත් හොඳින් පරිහරනය වෙනුවෙන් ලබා දෙන සහතිකය (සිංහල මාධ්‍යය)
2. පෙළපොත් හොඳින් පරිහරණය වෙනුවෙන් ලබා දෙන සහතිකය (දෙමළ මාධ්‍යය)
3. පෙළපොත් ඇණවුම් ලේඛනය සෘජු බෙදාහැරීම්
4. පෙළපොත් ඇණවුම් ලේඛනය මධ්‍යස්ථාන හරහා
5. මධ්‍යස්ථාන පෙළපොත් ඇණවුම් ලේඛනය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
කාර්ය සාධන වාර්තාව 2011

හැඳින්වීම

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත අධිශ්‍රේණිගත දෙපාර්තමේන්තුවකි. රජය මගින් පාසල් පෙළපොත් නොමිලේ ලබා දීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන වගකීමයි.

මීට අමතර ව අ.පො.ස. උසස් පෙළ හා වෙනත් ඉහළ විභාග සඳහා ගුණාත්මක බවින් යුත් අතිරේක කියවීම් පොත් ප්‍රකාශනය සහ අනෙකුත් ඉගෙනුම් ආධාරක සම්පාදනය මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අර්ථවත් කිරීමට දායක වීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරයට අයත් වේ.

පසුබිම් තොරතුරු

1965 මාර්තු 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව අධිකරණ අමාත්‍යාංශය යටතේ වෙන ම වැය ඒකකයක් වශයෙන් ස්ථාපනය කරන ලදි. අනතුරුව, 1966 සැප්තැම්බර් මස 30 දිනැති ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව එවකට පැවති අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතට පත්කරනු ලැබී ය.

1966 වර්ෂයේ පූර්වෝක්ත ගැසට් නිවේදනයෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට පහත දැක්වෙන වගකීම් පවරා ඇත.

- මූලික ද්විතියික හා උසස් අධ්‍යාපනයේ භාවිතය සඳහා සම්මත පාඩම් පොත් පරිවර්තනය කිරීම, ප්‍රසිද්ධ කිරීම, බෙදහැරීම හා විකිණීම, ප්‍රකාශන හිමිකම් මිලයට ගැනීම
- අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පාඩම් පොත්, ශබ්ද කෝෂ, කෝෂ ග්‍රන්ථ හා වෙනත් පොත් නිෂ්පාදනය, ප්‍රසිද්ධ කිරීම, බෙදහැරීම හා විකිණීම
- ශික්ෂණාධාර, ශ්‍රව්‍ය/ දෘශ්‍ය හා වෙනත් උපකරණ නිෂ්පාදනය, බෙදහැරීම හා විකිණීම
- කියවන ද්‍රව්‍ය නිෂ්පාදනය උනන්දු කරවීම

බී ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් පිහිටුවන ලද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 2004.07.14 දින අධිශ්‍රේණිගත කරන ලද අතර, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් තනතුර ද අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් වශයෙන් අධිශ්‍රේණිගත කරන ලදි. මෙම වැදගත් වෙනස්කම හේතු කොට ගෙන, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්වරයාගේ තත්ත්වය අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ තත්ත්වයට ඉහළ නැංවෙයි.

දැක්ම සහ මෙහෙවර

දැක්ම

අන්තර්ජාතික අධ්‍යාපනික සංවර්ධනය හා සමගාමී ව ඉහළ ගුණාත්මක භාවයකින් යුතු අධ්‍යාපනික ආධාරක සම්පාදනය කොට සැපයීමෙන් සැමට අධ්‍යාපනය ලබා දීම සහතික වීම

මෙහෙවර ප්‍රකාශය

රජය මගින් නොමිලේ පෙළපොත් ලබා දීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් ද අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සෙසු පෙළපොත්, වැඩපොත්, පරිවර්තන ග්‍රන්ථ, පාරිභාෂික ශබ්දමාලා, අතිරේක කියවීම් පොත්, කෝෂ ග්‍රන්ථ හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ඇතුළු අනෙකුත් ආධාරක සම්පාදනය කොට සැපයීමෙන් ද අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම ඔස්සේ රටට වැඩදායී ගුණවත්, නැණවත් හා නිපුණතාවලින් සපිරි පුරවැසි පිරිසක් බිහිකරලීමට දායක වීම

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා පරිපාලනය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක වශයෙන් කටයුතු කරන අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්වරයාට පරිපාලන කටයුතුවල දී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් වන කොමසාරිස්වරුන් දෙදෙනකුගේ ද නියෝජ්‍ය හා සහකාර කොමසාරිස්වරුන් 24 දෙදෙනෙකුගේ ද සහය ලැබේ. මුදල් අංශය භාරව ප්‍රධාන ගණකාධිකාරි වශයෙන් කටයුතු කරන්නේ ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ I පන්තියේ නිලධාරියෙකි.

පරිපාලනමය පහසුව තකා දෙපාර්තමේන්තුව පාලන අංශය, සංවර්ධන අංශය, නිෂ්පාදන හා ප්‍රකාශන අංශය, බෙදාහැරීම් අංශය සහ මුදල් අංශය යන ප්‍රධාන අංශ පහකට බෙදා තිබේ.

දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය පසු පිටේ දැක්වෙන සටහනේ දක්වා ඇත.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



ආයතන ශාඛාව

ආයතන ශාඛාවේ මූලික කාර්යය වනුයේ දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය හා සියලු ම කාර්ය මණ්ඩලවල ආයතනික කටයුතු සම්බන්ධයෙන් රාජකාරි කටයුතු ඉටුකිරීම යි.

2011.12.31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ.

තනතුර	අයත්වන සේවාව	පන්තිය හෝ ශ්‍රේණිය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.අ.ප.සේ.	I	01	01	
කොමසාරිස්	ශ්‍රී.ලං.අ.ප.සේ.	I	02	02	
ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රී.ලං.ග.සේ.	I	01	01	
ගණකාධිකාරි	ශ්‍රී.ලං.ග.සේ.	II/II	01		01
නියෝජ්‍ය කොමසාරිස්	ශ්‍රී.ලං.අ.ප.සේ.	II	38	24	13
සහකාර කොමසාරිස්		III		01 (විදේශගතව වැ.ර.නි)	
සහකාර කොමසාරිස් (තොරතුරු තාක්ෂණ පද්ධති විශ්ලේෂක)	ශ්‍රී.ලං.තො.සං.තා.සේ.	III	01	01	
පරිපාලන නිලධාරි	රා.ක.ස.සේ.	අධි පන්තිය	01	01	
වෙළඳ කළමනාකරු	දෙපාර්තමේන්තු ගත		01	01	
භාෂා පරිවර්තක	දෙපාර්තමේන්තු ගත		01		01
පරිගණක පිටු සැකසුම්කරු	දෙපාර්තමේන්තු ගත		06		06
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	රා.ක.ස.සේ. රා.ක.ස.සේ. රා.ක.ස.සේ.	I II III	53	13 13 18	09
පුස්තකාලාධිපති	පුස්තකාලාධිපති සේවය	III	01	01	
සංවර්ධන සහකාර	ආශ්‍රිත සේවා		20	04	16
මූල්‍ය සහකාර අයවැය සහකාර	ආශ්‍රිත සේවා ආශ්‍රිත සේවා		01 01	01 01	
රියදුරු	රියදුරු සේවය	I II ‘අ’ II ‘ආ’	12	02 02 05	03
කාර්යාල සේවක සේවය	කා.සේ.සේ.	I II III	15	03 01	11
වෙළඳ සහායක			15	09	06
ගබඩා මුරකරු	ප්‍රාථමික සේවය		07	06	01
ගබඩා කම්කරු	ප්‍රාථමික සේවය		35	27	08
විද්‍යාගාර සේවක	ප්‍රාථමික සේවය		01	01	
පුස්තකාල සේවක	ප්‍රාථමික සේවය		01	01	
එකතුව			**215**	**140**	**75**

2011 වර්ෂය තුළ දී ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්

තනතුර	ශ්‍රේණිය	මාරු වී පැමිණි සංඛ්‍යාව
1. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	I පන්තිය	01
2. ශ්‍රී.ලං.අ.ප.සේ.	III පන්තිය	01
3. සංවර්ධන සහකාර		04
4. මූල්‍ය සහකාර		01
5. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	I පන්තිය	04
6. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	II පන්තිය	01
7. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	III පන්තිය	03
8. රියදුරු	I පන්තිය	01
	II "අ" පන්තිය	02
	II "ආ" පන්තිය	02

2011 වර්ෂය තුළ දී ස්ථාන මාරු වී ගිය නිලධාරීන්

තනතුර		නිලධාරීන් සංඛ්‍යාව
1. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	I පන්තිය	02
2. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය	III පන්තිය	03
3. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	II පන්තිය	01
4. රියදුරු II "අ" පන්තිය		01

2011 වර්ෂය තුළ දී උසස් වීම් ලැබූ නිලධාරීන්

තනතුර	නිලධාරීන් සංඛ්‍යාව
1. ශ්‍රී.ලං.අ.ප.සේ. III සිට II පන්තියට	01
2. ගබඩා කම්කරු II සිට I පන්තියට	03

2011 වර්ෂය තුළ දී විශ්‍රාම ගන්නා ලද නිලධාරීන්

තනතුර	නිලධාරීන් සංඛ්‍යාව
1. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය I	02
2. වෙළඳ සහායක	01
3. රියදුරු සේවය	02
4. ගබඩා මුරකරු	01

2011 වර්ෂය තුළ නව පත්වීම්

තනතුර	නිලධාරීන් සංඛ්‍යාව
1. ශ්‍රී.ලං.පුස්ත.සේවය III	01
2. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය III	02

2011 වර්ෂය තුළ විදේශ පුහුණුවීම්

1. ලෝක බැංකු සංවර්ධන අරමුදල යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන මගින් 2011.02.21 දින සිට 2011.03.02 දින දක්වා තායිලන්තයේ පෙළපොත් සංස්කරණයට අදාළ විදේශ පුහුණුවීම සඳහා ගණකාධිකාරි සේවයේ 11 ශ්‍රේණියේ නිලධාරි මහතකු හා ශ්‍රී.ලං.අ.ප.සේ. III නිලධාරීන් 06 දෙනකු සහභාගි වී ඇත.

2. දෙපාර්තමේන්තු අරමුදලේ මානව සම්පත් වැය ශීර්ෂ යටතේ වෙන්වී ඇති ප්‍රතිපාදන මගින් 2011.12.12 දින සිට 2011.12.21 දින දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර පෙළපොත් නිෂ්පාදනය පිළිබඳ විදේශ පුහුණු වැඩමුළුව සඳහා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා ශ්‍රී.ලං.අ.ප.සේ. II පන්තියේ නිලධාරියකු හා III පන්තියේ නිලධාරීන් තුන් දෙනෙකු සහභාගි වී ඇත.

3. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ හැකියා ධාරිතා වැය ශීර්ෂ යටතේ වෙන්වී ඇති ප්‍රතිපාදන මගින් 2011.12.26 දින සිට 2011.12.31 දින දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර පෙළපොත් සංස්කරණය කිරීම පිළිබඳ විදේශ වැඩමුළුව සඳහා ශ්‍රී.ලං.අ.ප.සේ. I පන්තියේ නිලධාරීන් දෙදෙනෙකු, II පන්තියේ නිලධාරීන් දෙදෙනෙකු හා III පන්තියේ නිලධාරීන් පස් දෙනෙකු සහභාගි වී ඇත.

සංවර්ධන අංශය

වත්මන් ලෝකයේ නව ප්‍රවණතාවලට ගැළපෙන පරිදි ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කරනු ලබන විෂය නිර්දේශ සහ විෂයමාලාවට අනුකූල ව පෙළපොත් සම්පාදනය කිරීම හා නැවත මුද්‍රණය කරනු ලබන පෙළපොත්වල ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා විවිධ උපාය මාර්ග සැලසුම් කර ක්‍රියාත්මක කිරීම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යභාරය යි.

මෙයට අමතරව උසස් විභාගවලට පෙනී සිටින සිසු සිසුවියන් සඳහා දැනුම සපයන අතිරේක පොත් රචනා කිරීම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය වෙත පැවරී ඇති තවත් කාර්යභාරයකි.

සංවර්ධන අංශය කොමසාරිස්වරියකගේ සෘජු අධීක්ෂණය යටතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන අංශ තුනක් වශයෙන් ක්‍රියාත්මක වේ. 2011 වර්ෂය සඳහා වන පෙළපොත් සම්පාදනය කරන ලද්දේ විෂය භාර නියෝජ්‍ය හා සහකාර කොමසාරිස්වරුන් විසි හතර දෙනකුගේ දායකත්වයෙනි.

2007 වර්ෂයේ සිට පාසල් පද්ධතියට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක විෂයමාලාව පදනම් කරගෙන අද දක්වා පෙළපොත් සම්පාදනය වේ. 2011 වර්ෂය තුළ දී පිරිවෙන් පොත් යාවත්කාලීන කිරීම කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු විය. මේ අනුව 2011 වර්ෂය තුළ දී 15 ශ්‍රේණිවලට අදාළ ව පාලි, සංස්කෘත, සිංහල, සමාජ විද්‍යාව, ත්‍රිපිටක ධර්මය, ඉතිහාසය හා දෙමළ භාෂාව සඳහා නව පිරිවෙන් පෙළපොත් සම්පාදනය කරන ලදි (මීට පෙර දෙමළ භාෂාව සඳහා පිරිවෙන් පෙළපොත් සම්පාදනය නොවූ අතර මෙම වර්ෂයේ දී එම කාර්යය සාර්ථක කර ගත හැකි වීම ප්‍රකාශන දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි).

සංවර්ධන අංශය සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍ය තුනෙන් ම පෙළපොත් සම්පාදනයෙහි නිරත වේ. එමෙන් ම ද්වි භාෂා අධ්‍යාපන ප්‍රතිපත්තිය වඩාත් තහවුරු කිරීම අරමුණු කරගෙන සෑම වැඩසටහනක් ම මෙහෙයවනු ලබයි. මාධ්‍ය තුනට ම අදාළ ව පෙළපොත්වල ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා 2010 වසරේ ක්‍රියාත්මක වූ විවිධ ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති තවදුරටත් ඉදිරියට ගෙන යන ලදි. එමෙන් ම මාධ්‍ය අනුව පෙළපොත් අතර ඒකාග්‍රතාවක් ඇති කිරීම සහ ජාති, ආගම් හෝ වෙනත් කරුණු අනුව පෙළපොත්වල ඇති විය හැකි විවිධ විෂමතා අවම කිරීම කෙරෙහි ද විෂය කරුණු යාවත්කාලීන කිරීම කෙරෙහි ද 2011 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු විය.

2011 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්

01. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරනු ලබන පෙළපොත්වල ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා 2011 වර්ෂය තුළ දී ද විවිධ උපාය මාර්ග ක්‍රියාත්මක කරනු ලැබිණි. ඒවා විස්තරාත්මක ව පහත දැක්වේ.

- 2012 වර්ෂය සඳහා මුද්‍රණය කරනු ලබන පෙළපොත්වල ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ තලවල සම්පත්දායකයින්ගේ සහභාගිත්වය ඇති ව පෙළපොත් සංස්කරණ වැඩමුළු 08ක් පවත්වන ලදි. පවත්වන ලද වැඩමුළුවල සාරාංශය පිළිබඳ සටහනක් ඊළඟ පිටුවේ දැක්වේ.

අංකය	දින ගණන	වැඩමුළු පැවැත්වූ විෂය	සහභාගී වූ සංඛ්‍යාව
01	2011/02/08, 09, 10, 11	ගණිතය (සි/ඉ/දෙ) විද්‍යාව (සි/ඉ/දෙ) භූගෝල විද්‍යාව (සි/දෙ) ව්‍යාපාර හා ගිණුම් (සි/දෙ/ඉ) ගෘහ ආර්ථික විද්‍යාව (සි) බුද්ධ ධර්මය	85
02	2011/02/22, 23, 24, 25	ක්‍රිස්තු ධර්මය (සි/දෙ) කතෝලික ධර්මය (සි/දෙ) ඉතිහාසය (සි/දෙ) දෙවන බස (සි) පුරවැසි අධ්‍යාපනය (සි/දෙ) ඉංග්‍රීසි ප්‍රා.තා.කු. (සි/දෙ) සෞඛ්‍යය (සි/දෙ/ඉ) ව්‍යවසායකත්ව අධ්‍යයනය (සි/දෙ) ගෘහ ආර්ථික විද්‍යාව (දෙ) හින්දු ධර්මය (දෙ) භූගෝල විද්‍යා (ඉ)	129
03	2011/03/03, 04	බුද්ධ ධර්මය ගණිතය (සි/දෙ/ඉ) විද්‍යාව (සි/දෙ/ඉ) ගෘහ ආර්ථික විද්‍යාව	44
04	2011/03/10, 11	සෞඛ්‍යය (සි/දෙ) කතෝලික ධර්මය (දෙ) ප්‍රා.තා.කු. (සි) ඉංග්‍රීසි පුරවැසි අධ්‍යාපනය (සි)	34
05	2011/03/21, 22, 23, 24, 25	විද්‍යාව (සි/දෙ) දෙවන බස (සි) භූගෝල විද්‍යාව (සි/දෙ) ගණිතය (සි/දෙ) ගෘහ ආර්ථික විද්‍යාව (සි/දෙ) ව්‍යාපාර හා ගිණුම් (සි/දෙ) ඉතිහාසය (සි/දෙ) සෞඛ්‍යය (දෙ)	42

06	2011/03/22, 23, 24, 25	බුද්ධ ධර්මය ඉස්ලාම් ධර්මය (සි) සිංහල භාෂාව හා සාහිත්‍යය දෙමළ භාෂාව හා සාහිත්‍යය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (සි) කෘෂි හා ආහාර තාක්ෂණය (සි/දෙ) ධීවර හාආහාර තාක්ෂණය (දෙ) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය (දෙ) දෙවන බස දෙමළ දෙමළ සාහිත්‍ය රසාස්වාදය නිර්මාණකරණය හා තාක්ෂණය (සි/දෙ)	69
07	2011/03/30, 31	සෞඛ්‍යය කෘෂි හා ආහාර තාක්ෂණය (දෙ) දෙවන බස දෙමළ සිංහල භාෂාව හා සාහිත්‍යය විද්‍යාව (දෙ) ඉතිහාසය (දෙ) ක්‍රිස්තු ධර්මය (සි/දෙ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	43
08	2011/04/05, 06, 07, 08	බුද්ධ ධර්මය විද්‍යාව (සි/දෙ) සෞඛ්‍යය (සි/දෙ) ප්‍රා.තා.කු. (සි/දෙ) ව්‍යාපාර හා ගිණුම් (සි/දෙ) ඉතිහාසය (සි/දෙ) භූගෝල විද්‍යාව (සි/දෙ) ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය (සි/දෙ) ක්‍රිස්තු ධර්මය (සි/දෙ) කතෝලික ධර්මය (සි/දෙ) සිංහල ගණිතය (සි/දෙ/ඉ) ඉස්ලාම් (සි/දෙ) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (සි/දෙ) ශෛවනරි දෙමළ භාෂාව හා සාහිත්‍යය	100

- මෙම වැඩමුළුවල දී ඒ ඒ පොත්වල විෂය කරුණු සහ භාෂාවේ නිවැරදි බව කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදි. තව ද විෂය කරුණු යාවත්කාලීන කිරීම මෙන් ම නොගැළපෙන කරුණු ඉවත් කිරීම ද මෙහි දී සිදු විය.

- පෙළපොත්වල ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා සිදු කළ යුතු වෙනස්කම් පිළිබඳ ව හඳුනා ගැනීමට පිහිටුවනු ලැබූ **සම්පත් පුද්ගල සංචිතයේ** සම්පත්දායකයින් විෂය ක්ෂේත්‍ර අනුව බෙදී ඇති ආකාරය දැක්වෙන සටහනක් පහත දැක්වේ.

අනු අංකය	විෂයයන්	ගුරු මධ්‍යස්ථාන/ ගුරු විද්‍යාල/ විද්‍යාපීඨ	විශ්වවිද්‍යාල ආචාර්ය/ මහාචාර්ය/ කථිකාචාර්ය	අධ්‍යාපන අධ්‍යක්ෂවරු	විදුහල්පති/නි. විදුහල්පති	ගුරුවරු	ගුරු උපදේශකවරු	වෙනත්	එකතුව
1	සිංහල භාෂාව හා සාහිත්‍යය	37	39	2	3	11	4	9	**105**
2	විද්‍යාව	17	100	10	2	13	8	9	**159**
3	ගණිතය	24	26	9	0	14	9	7	**89**
4	සමාජ විද්‍යා විෂයයන්	0	18	0	1	5	8	1	**33**
5	සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය	14	25	1	0	4	4	3	**51**
6	ඉංග්‍රීසි	32	20	4	1	10	6	6	**79**
7	බුද්ධ ධර්මය	15	23	5	1	5	2	7	**58**
8	ඉතිහාසය	15	17	9	2	11	8	3	**65**
9	භූගෝල විද්‍යාව	16	34	3	0	9	4	7	**73**
10	කතෝලික ධර්මය	1	1	2	0	0	0	0	**4**
11	ක්‍රිස්තු ධර්මය	2	0	1	0	3	0	0	**6**
12	ඉස්ලාම් ධර්මය	2	4	2	0	2	1	1	**12**
13	හින්දූ ධර්මය	3	6	2	0	1	3	0	**15**
14	ජීවන නිපුණතා	20	6	1	0	5	5	7	**44**
15	දෙවන බස (දෙමළ)	2	1	0	0	0	2	0	**5**
16	ගෘහ ආර්ථික විද්‍යාව	5	0	2	0	0	0	1	**8**
17	තොරතුරු තාක්ෂණය	9	42	10	0	42	18	10	**131**
18	සෞන්දර්ය විෂයයන්	20	18	4	1	11	2	2	**58**
19	දෙමළ භාෂාව	6	6	4	3	13	3	4	**39**
20	ප්‍රාථමික විෂයයන්	4	0	5	2	2	10	3	**26**
21	කෘෂිකර්මය	3	33	1	0	2	0	0	**39**
22	භාෂා (හින්දි/ප්‍රංශ)	1	8	2	0	0	0	0	**11**
23	වාණිජ්‍ය හා ගිණුම්කරණය	2	73	3	0	5	2	1	**86**
24	ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා	4	19	0	0	0	1	1	**25**
25	වෙනත් අතිරේක කියවීම්	37	18	6	6	5	11	12	**95**
									1316

- හැඳින්වීමෙහි සඳහන් කළ පරිදි 15 ශ්‍රේණිවලට අදළව නව පිරිවෙන් පෙළපොත් සම්පාදනය කිරීම 2011 වර්ෂයේ දී සිදු කළ කාර්යයකි.

02. පාසල් පෙළපොත් සම්පාදනයට අමතරව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවශ්‍ය වන වෙනත් ඉගෙනුම් ද්‍රව්‍ය සම්පාදනය ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්යභාරයට ඇතුළත් වේ. මීට අදළව 2011 වර්ෂයේ දී ඉටු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

- විෂය නිර්දේශය සහ ශිෂ්‍යත්ව ප්‍රශ්නපත්‍රයෙන් පරීක්ෂා කිරීමට අපේක්ෂිත නිපුණතා ද අන්තර්ගත කර 2011 වර්ෂයේ පැවැත්වූ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්නෝත්තර සංග්‍රහය සම්පාදනය කිරීම
- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටින දරුවන්ට ප්‍රයෝජනවත් වන පරිදි සියලු ම හර විෂයයන් සඳහා පසුගිය විභාග ප්‍රශ්නපත්‍ර සංග්‍රහයක් මාධ්‍ය තුනෙන් ම එළිදැක්වීම
- අ.පො.ස. උසස් පෙළ කලා, වාණිජ සහ විද්‍යා විෂයධාරාවන්ට අදළ ප්‍රශ්නපත්‍ර සංග්‍රහ සම්පාදනය කිරීම
- මෙයට අමතර ව උසස් පෙළ අතිරේක කියවීම් පොත් වශයෙන් පහත සඳහන් පොත් සම්පාදනය විය.

පුරාතන ගද්‍ය සංග්‍රහය
ගිරා සංදේශය
කෙටිකථා සංග්‍රහය
උසස් පෙළ භෞතික භූගෝල විද්‍යාව I
නූතන පද්‍ය සංග්‍රහය
ආර්ථික වර්ධනය හා සංවර්ධනය
උසස් පෙළ ගිණුම්කරණය

- නව ගිණුම්කරණ ප්‍රවේශ
- සමාගම් ගිණුම්කරණය
- අනුමත විශ්ලේෂණය

ඉහත සඳහන් පොත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන සහ අප දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සියලු පොත් වෙළඳසැල්වලින් සහන මිලට ලබා ගත හැකිය.

03. අධ්‍යාපන ආංශික සංවර්ධන ප්‍රවේශ රාමුව සහ වැඩසටහන යටතේ ලෝක බැංකුවෙන් ලැබෙන ආධාර මගින් පිටිපන පොත් ගබඩා සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු 2011 වර්ෂයේ දී තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. ගබඩා සංකීර්ණයේ III අදියර ඉදිකිරීම ආරම්භ කිරීම මෙම වර්ෂයේ දී සිදු වූ විශේෂ සිදුවීමකි.

04. මානව සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ ඉන්දියාවේ නවදිල්ලි නුවර Institute of book publishing ආයතනයේ පවත්වන ලද පොත් මුද්‍රණය හා සංස්කරණය පිළිබඳ වූ පුහුණු පාඨමාලා (දින 10 සහ දින 06) දෙකකට නිලධාරීන් 15 දෙනෙකු සහභාගි කරවන ලදි.

05. භෞතික තත්ත්වයෙන් උසස් පොත් සම්පාදනය කිරීමේ අරමුණින් පොත් මුද්‍රණය සඳහා භාවිත කරන කඩදාසිවල ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා විද්‍යාගාරයක් පවත්වා ගෙන යන අතර 2011 වර්ෂයේ දී සෑම පොතක් සඳහා ම භාවිත කඩදාසිවල පහත සඳහන් ගුණාංග පරීක්ෂා කිරීමට කටයුතු කරන ලදි.

GSM 80 + 2.5 (Tolerance)
Printing paper - Quality Wood Free Surface Sized
(දැව අඩු බව)

Brightness (ISO) - 82% minimum
(කඩදාසියේ දීප්තිය)

Opacity - 90% minimum
(පාරාන්ධ බව)

Tensile Index - MD - 35 min kNm/kg
- CD - 20 min kNm/kg
(මුද්‍රණ කඩදාසියේ ආතතිය)

සහතික පත්‍ර ප්‍රදානය

පාසල් පෙළපොත් නැවත භාවිතය පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 01 33 හා 2008.23 දරන චක්‍රලේඛයෙහි V වන වගන්තිය මගින් නිර්දේශිත පරිදි 2011 වසරේ සෑම පංතියක ම ඉතා ම හොඳින් පෙළපොත් පරිහරණය කර ඇති බව සනාථ වූ ශිෂ්‍යයන් තිදෙනෙකුට සහතික පත් ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලදි.

සහතික පත් ප්‍රදානය කිරීමේ දිනය වශයෙන් දිවයින පුරා පාසල් පෙළපොත් බෙදාදීමේ දිනය වූ 2011 දෙසැම්බර් 06 යොදා ගැනිණි.

මෙම වැඩසටහන මගින් 2011 වර්ෂයේ දී පෙළපොත් නාස්තිය බොහෝ දුරට සීමා කර ගැනීමටත් නැවත භාවිතය 6, 7, 8 හා 9 ශ්‍රේණිවල 30%කින් වර්ධනය කර ගැනීමටත් හැකි වී ඇත.

2011 වර්ෂයේ දී පාසල් සිසුනට ප්‍රදානය කරන ලද සහතිකයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය පිටපත් ඇමුණුම 1 හා ඇමුණුම 2 වශයෙන් ඉදිරිපත් කර ඇත.

තොරතුරු තාක්ෂණ ඒකකය

පෙළපොත්, අතිරේක කියවීම් පොත් හා අනෙකුත් ලේඛන පරිගණකගත කිරීම හා ඒවායේ මෘදු පිටපත් මුද්‍රණය සඳහා සුදුසු පරිදි සකස් කිරීම තොරතුරු තාක්ෂණ ඒකකයේ ප්‍රධාන කාර්ය භාරය වේ. දෙපාර්තමේන්තුවේ දත්ත පාදකය පවත්වා ගෙන යාම හා යාවත්කාලීන කිරීම මෙම ඒකකයට පැවරී ඇත. තොරතුරු තාක්ෂණ විෂය භාර සහකාර කොමසාරිස්වරියක හා පද්ධති විශ්ලේෂක නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ මෙහි සියලු ම කටයුතු ක්‍රියාත්මක වේ. තොරතුරු තාක්ෂණ ඒකකය විසින් සිදු කෙරෙන කාර්යයන්ට සහය වීම සඳහා අනියම් පදනමින් කටයුතු කරන කනිෂ්ඨ සේවකයෝ 08 දෙනෙක් මෙම අංශයේ සේවයේ යොදවා සිටිති.

2011 වර්ෂය තුළ මෙම ඒකකය මගින් ඉටුකරන ලද කාර්යයන්වල සාරාංශයක් පහත දැක්වේ.

1. 2012 වර්ෂයේ ඇණවුම් ලේඛන සකස් කර මුද්‍රණයට භාර දීම
2. 2012 වර්ෂයේ මුද්‍රණයට අවශ්‍ය පෙළපොත් ප්‍රමාණ පිළිබඳ දත්ත නිෂ්පාදන අංශයට ලබා දීම
3. සංවර්ධන අංශයේ සම්පාදිත පෙළපොත් පරිගණකගත කිරීම සහ මෘදු පිටපත් සකස් කිරීම
4. ගබඩාවල පෙළපොත් බෙදහැරීමේ දත්ත පරිගණකගත කිරීමට අවශ්‍ය පරිගණක වැඩසටහන් නිර්මාණය කර ගබඩාවල දත්ත පාදක පවත්වා ගෙන යාම
5. බෙදූ අවසන් පෙළපොත් ප්‍රමාණය හා පිරිවැය මුදල් අංශයට ලබා දීම
6. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම
7. දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශනය කරන පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර සංග්‍රහවල, පිටකවර නිර්මාණය කිරීම
8. පෙළ පොත් නිසි ලෙස පරිහරණය කළ දරුවන්ට බෙදූ දුන් සහතික පත්‍රය නිර්මාණය කිරීම
9. අතිරේක කියවීම් පොත් පරිගණකගත කිරීම
10. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන ආරාධනා පත්‍ර, බැනර්, පෝස්ටර් නිර්මාණය කිරීම
11. දෙපාර්තමේන්තුවේ සියලු ම පරිගණක නඩත්තු කිරීම

නිෂ්පාදන අංශය

හැඳින්වීම

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන අංශයෙහි, නිෂ්පාදන හා බෙදහැරීම් කොමසාරිස්වරිය යටතේ සහකාර කොමසාරිස්වරියන් දෙදෙනෙක්, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරිනියන් දෙදෙනෙක්, කාර්යාල කාර්ය සහායිකාවක් හා අනියම් පදනම මත සේවය කරන සේවකයන් දෙදෙනෙක් ද සේවය කරති. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම මත පාසල් සිසුන් සඳහා සම්පාදනය කරන සියලු ම පෙළපොත් රජයේ මුද්‍රණාලය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව හා පෞද්ගලික අංශයේ මුද්‍රණකරුවන්ගේ මාර්ගයෙන් මුද්‍රණය කරවීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. මීට අමතර ව ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්පාදනය කරන ලද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හා විෂය නිර්දේශ මුද්‍රණය කිරීම ද සිදු කෙරේ.

2011 වර්ෂය තුළ මෙම අංශය මගින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

1. පාසල් පෙළපොත් ටෙන්ඩරය ලබා දීමට පෙර පිරිවිතර සෑදීම සඳහා තොරතුරු රැස් කිරීම. තොරතුරු තාක්ෂණ ඒකකය, බෙදහැරීම් අංශය හා ගබඩාවලින් තොග ශේෂ ලබා ගැනීම.

2. එම තොග ශේෂයන් පදනම් කර ගනිමින් පිරිවිතර කමිටුවක් මගින් 2012 පාසල් පෙළපොත් මුද්‍රණය සඳහා පිරිවිතර සකස් කිරීම.

3. පිරිවිතර කමිටුවෙන් සකස් කරන ලද වාර්තා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමා ලවා අනුමත කර මුද්‍රල් අංශයට භාර දීම.

4. එක් එක් විෂයභාර නිලධාරීන්ට Press copy හා Transferred copy ලබා දී ඒවායේ සංශෝධන ඇතුළත් කරගෙන අදාළ සංයුක්ත තැටිය තොරතුරු තාක්ෂණ අංශයෙන් පරීක්ෂා කරවා ගැනීම.

5. අදාළ ටෙන්ඩර් දිනාගත් සමාගම්වලට Press copy හා නිවැරැදි සංයුක්ත තැටි ලබා දීම.

6. සෝදුපත් අවස්ථාවේ සිට ගුණාත්මක පරීක්ෂාව සිදුවන තුරු ම පොත්වල සියලු ම කටයුතු පරීක්ෂා කිරීම.

7. නියමිත කාලය තුළ මුද්‍රණකරුවන් උනන්දු කර නිවැරැදි පොත් තොග ගබඩා වෙත ලබා දීම.

8. පෙළපොත්වල නිවැරැදි කිරීම් කළ යුතු විට සහ පොත් තොගවල වැරදි නිවැරැදි කළ යුතු විට නිෂ්පාදකයන් දැනුවත් කර ඒවා නිවැරැදි කිරීම.

9. අවශ්‍ය විට අවශ්‍ය මුද්‍රණාල පරීක්ෂා කිරීම හා ඒවායේ මුද්‍රණ සැලසුම් ලබාගෙන ඒවා පරීක්ෂා කිරීම සහ නිෂ්පාදන ප්‍රගතිය පිළිබඳ ව දෛනික වාර්තා සැකසීම.

10. පාසල් පෙළපොත්වල භෞතික තත්ත්වය දියුණු කිරීමට කටයුතු කිරීම. ඒ අනුව ඇතුළත කඩදාසිය හා පිට කවරය සඳහා සිව් වර්ණ චිත්‍ර හා සිතුවම් යෙදීම. පිට කවරය සඳහා ආට්බෝඩ් ලැමිනේටඩ්, 220gsm කඩදාසිය යෙදීම මගින් ආකර්ෂණීය පොත් පෙළක් සිසුන් අතට පත් කිරීම.

11. සෑම පොතක් ම පිරිවිතරයට අනුකූල ද යන්න පරීක්ෂා කිරීමට විද්‍යාගාර වාර්තාවක් ලබා ගැනීම.

12. ජාතික අධ්‍යාපන ආයතනය සමග සම්බන්ධ වී ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය කිරීම.

13. අතිරේක පොත් මුද්‍රණය කිරීම.

14. විභාග දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ), 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව ප්‍රශ්නෝත්තර පොත් මුද්‍රණය කිරීම.

ප්‍රකාශන අංශය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයෙහි නිෂ්පාදන හා බෙදාහැරීම් කොමසාරිස්වරිය යටතේ, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් හය දෙනෙක් ද අනියම් පදනම මත බඳවා ගෙන ඇති සේවකයෙක් ද සේවය කරයි.

2011 වර්ෂයේ ප්‍රකාශන අංශය විසින් සිදුකර ඇති කාර්යභාරය සාරාංශ කොට පහත දක්වා ඇත.

1. පෙළපොත් සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණයට අදාළ ඇණවුම් මුද්‍රණකරුවන් වෙත ලබා දීම

2. ගිවිසුම් සකස් කර මුද්‍රණකරුවන් සමග ගිවිසුම්වලට එළඹීම

3. අතිරේක පොත්, ඇස්තමේන්තු කැඳවීමේ සිට මුද්‍රණය දක්වා සියලු ම කටයුතු

4. ටෙන්ඩරයෙන් පරිබාහිර පෙළපොත් සඳහා ඇස්තමේන්තු කැඳවීමේ සිට ඇණවුම් භාර දීම දක්වා සියලු ම කටයුතු

5. පොත්වල මිල නියම කිරීම

6. මුද්‍රණකරුවන් වෙත ගෙවීම් කිරීමට අදාළ වවුචර් සකස් කිරීම

බෙදාහැරීමේ අංශය

හැඳින්වීම

පෙළපොත් බෙදාහැරීමේ අංශය නිෂ්පාදන හා බෙදහැරීම් කොමසාරිස්වරියක යටතේ පාලනය වේ. සහකාර කොමසාරිස්වරයකු සහ රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ නිලධාරීන් 02 දෙනෙකුට අමතර ව අනියම් පදනමින් කටයුතු කරන කනිෂ්ඨ සේවකයෝ 22 දෙනෙක් ද සේවයේ යොදවා සිටිති. රජයේ හා රජයෙන් ආධාර ලබන පාසල්වල 111 දක්වා ශ්‍රේණිවල ඉගෙනුම ලබන මිලියන 04 කට අධික ශිෂ්‍ය සංඛ්‍යාවකට එක් එක් පාසල් වර්ෂය ආරම්භ වීමට පෙර පෙළපොත් බෙදාදීම මෙම අංශයට පැවරී ඇති කර්තව්‍යය වේ. මෙම කාර්යයේ දී පාසල්වලින් හා බෙදහැරීම් මධ්‍යස්ථානවලින් ලබා ගත්නා සංඛ්‍යා ලේඛන පදනම් කරගෙන එක් එක් පාසල් හා මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය වන පොත් ප්‍රමාණය තීරණය කරනු ලැබේ. ඉදිරි වර්ෂය සඳහා අවශ්‍ය වන සියලු පෙළපොත් ප්‍රමාණය තීරණය වනුයේ මෙම සංඛ්‍යා ලේඛන පදනම් කරගෙන ය (ඇණවුම් ලේඛන ඇමුණුම 3, 4, 5 යටතේ දක්වා ඇත)

2011 වර්ෂය තුළ මෙම අංශය මගින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

පෙළපොත් බෙදහැරීම

2011 පොත් බෙදීමේ වැඩසටහනට අනුව දිවයින පුරා පිහිටි ජාතික පාසල්වලට ද ශිෂ්‍ය සංඛ්‍යාව 2000ට වැඩි පළාත් පාසල්වලට ද රජයේ අනුග්‍රහයෙන් නොමිලේ පෙළපොත් ලබා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 2000ට වැඩි පෞද්ගලික පාසල්වට ද සෘජු ව ම පෙළපොත් නිකුත් කරන ලදි. රජයේ පාසල් 9700ක, රජයේ අනුමත පෞද්ගලික පාසල් 75, පිරිවෙන් 772ක්, ගුරු විද්‍යාල හා විද්‍යාපීඨවලට ද ඇතුළත් ව ලක්ෂ 41ක ශිෂ්‍ය ප්‍රජාවට පෙළපොත් වර්ග 364ක් බෙදහරිනු ලැබිණි. පිටපත් මිලියන 30කට ආසන්න පොත් ප්‍රමාණයක් සඳහා රුපියල් මිලියන 3000කට ආසන්න පිරිවැයක් මීට යොදවනු ලැබීය.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ බෙදහැරීම

දිවයිනේ පාසල්වල අවශ්‍යතාවන් අනුව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ බෙදා හරින ලදි.

පොත් බෙදාහැරීමේ උප කමිටු

පොත් බෙදාහැරීමේ දී විශේෂ අවධානය යොමු විය යුතු අංශ සඳහා උප කමිටු කිහිපයක් පත් කරන්නට යෙදිණි.

(අ) පෙළපොත්වල ගුණාත්මක තත්ත්වය ඇගයීමේ කමිටුවල නිලධාරී සංඛ්‍යාව ඒ ඒ මාධ්‍ය වශයෙන් තෝරා පත්කර ගබඩාවලට ලැබෙන පොත් අහඹු පරීක්ෂාවකට ලක් කිරීමේ වැඩපිළිවෙළ විධිමත් කරන ලදි.

(ආ) වැඩසටහන් සම්පාදන හා ප්‍රගති පාලන ඒකකයක් පොත් බෙදීමේ අංශයට එක් කරන ලදි. පොත් බෙදීමේ වැඩසටහන සැලසුම් කිරීම සහ පාසල්වලට, බෙදාහැරීමේ මධ්‍යස්ථානවලට හා කොට්ඨාසවලට යැවෙන පොත් සඳහා නිකුත් කිරීමේ ලේඛන සකස් කිරීම මෙහි කාර්යභාරය විය. ගබඩාවලට ලැබෙන පොත් වර්ග හා සංඛ්‍යා පිළිබඳ දෛනික තොරතුරු ලබා ගනිමින් නිකුත් කිරීමේ ලේඛන පිළියෙල කිරීමේ හේතුවෙන් එකම දිස්ත්‍රික්කයකට පොත් ප්‍රවාහනය කරන වාර ගණන අඩු කර ගැනීමට මෙයින් ඉඩකඩ සැලසේ.

පෙළපොත් ඇණවුම් ලේඛන වර්ග 3ක් මුද්‍රණය කොට කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ විදුහල්පතිවරුන් වෙත ලබා දෙන ලදි. මූලික පිරිවෙන්වලට අදාළ පෙළපොත් ද කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ජාලය ඔස්සේ බෙදහරින බැවින් මූලික පිරිවෙන්වල පරිවේණාධිපති හිමිවරුන් විසින් පිරිවෙන්වලට අවශ්‍ය පෙළපොත් පිළිබඳ සංඛ්‍යා ලේඛන ද වාර්ෂික පෙළපොත් ඇණවුම් ලේඛනවලට ම ඇතුළත් කිරීමට පියවර ගනු ලැබිණි.

පෙළපොත් නැවත භාවිතය

පාසල් සිසුන්ට නොමිලේ සපයනු ලබන පෙළපොත් වර්ෂය අවසානයේ දී නැවත භාවිතය සඳහා පාසලට භාර දිය යුතු ය. (ප්‍රාථමික අංශය සඳහා මුද්‍රිත පෙළපොත්, වැඩපොත් සහ අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටින සිසුන්ගේ පොත් නැවත ලබා නොගනී). පෙළපොත්වල පරිහරණ ආයු කාලය වසර 03ක් දක්වා වැඩි කිරීමේ අරමුණ ඇතිව පොත්වල භෞතික ගුණාත්මකභාවය වැඩි දියුණු කරන ලදි.

2012 වසර සඳහා පොත් බෙදහැරීමේ නිල උත්සවය මෙවර සංවිධානය කරනු ලැබුයේ මහනුවර උසස් බාලිකා විදුහලේ දී ය. 2011 දෙසැම්බර් මස 06 වන දින එම උත්සවය ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් පවත්වන ලදි. එහි දී විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා පෙළපොත් සහ සහතික පත්‍ර ප්‍රදානය සිදුකිරීම විශේෂ කරුණකි. දිවයින පුරා සියලු පාසල්වල පාසල් පෙළපොත් බෙදදීමේ දිනය මෙම උත්සවයට සමගාමී ව සිදු කරන ලදී.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සෘජු ව පොත් ලබා දෙන ස්ථාන පළාත් අනුව ව්‍යාප්ත ව ඇති ආකාරය 2011

අනු අංකය	පළාත	කොට්ඨාස අධ්‍යාපන කාර්යාල	නව බෙදහැරීම් මධ්‍යස්ථාන	ජාතික පාසල්	සිසුන් 2000ට වැඩි පළාත් පාසල්	සිසුන් 2000ට වැඩි රජයේ ආධාර ලබන පෞද්ගලික පාසල්	කොළඹ කලාපයේ සහ නුගේගොඩ කොට්ඨාසයේ සිසුන් 2000ට අඩු පාසල්	එකතුව
1	බස්නාහිර	31	18	69	56	21	135	330
2	මධ්‍යම	51	4	54	16	02	00	127
3	දකුණ	34	14	63	08	01	00	120
4	උතුර	33	07	11	03	01	00	55
5	නැගෙනහිර	46	00	30	03	00	00	79
6	වයඹ	30	16	35	17	00	00	98
7	උතුරු මැද	22	18	10	08	00	00	58
8	ඌව	22	18	36	07	00	00	83
9	සබරගමුව	01	82	28	10	00	00	121
	එකතුව	**270**	**177**	**336**	**128**	**25**	**135**	**1071**

මුදල් අංශය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති වාර්ෂික ව රුපියල් මිලියන 2,400ක් පමණ ප්‍රතිපාදනයක් මත කටයුතු කරන තනි මූල්‍ය ඒකකයකි.

පොත් ප්‍රකාශනයට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම් ඇතුළු සියලු කටයුතු සඳහා අවශ්‍ය වන අධිකාරි බලය හා මූල්‍ය බලතල ලබා දෙමින් පොත් ප්‍රකාශනය කාර්යක්ෂම ව ඉටු කිරීමට හැකි වන සේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක තත්ත්වයට අධිශ්‍රේණිගත කරනු ලැබ ඇත.

මුදල් අංශය භාර ව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තියේ ගණකාධිකාරීවරයෙක් කටයුතු කරන අතර, I හෝ II ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරක පුරප්පාඩුවක් පවතී.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමෙහි ලා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් ඉටු කෙරෙන මූලික කාර්යභාරය වනුයේ පෙළපොත් නොමිලේ ලබා දීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින් පාසල් සිසුන් සඳහා පෙළපොත් සම්පාදනය, මුද්‍රණය හා දිවයින පුරා බෙදහැරීමයි. මීට අමතර ව උසස් පෙළ සහ වෙනත් විභාග ඉලක්ක කොට ගත් අධ්‍යාපන ප්‍රකාශන සහ පසුගිය වර්ෂවල විභාග ප්‍රශ්න පත්‍ර සංග්‍රහ සම්පාදනය කොට සහනදායී මිලට වෙළඳ පොළට නිකුත් කරයි.

දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම ආදායම් මාර්ගය වනුයේ පොත් අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන පවත්වා ගෙන යාමයි.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රය
ඕල්කට් මාවත
යාපනය
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම
මීපේ
කොටුව දුම්රිය ස්ථානය

පෙළපොත්, අතිරේක කියවීම් පොත්, පරිවර්තන ග්‍රන්ථ, පාරිභාෂික ශබ්ද මාලා, කෝෂ ග්‍රන්ථ සහ අධ්‍යාපනික සංයුක්ත තැටි ද එම මධ්‍යස්ථානවල අලෙවි කෙරෙන අතර ම, ජාතික විෂයමාලාව යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දෙන පෞද්ගලික පාසල්වලට පෙළපොත් අලෙවි කිරීම ද 2008 වර්ෂයේ සිට ආරම්භ කෙරිණි. 2011 වර්ෂයේ දී ජංගම රථ දෙකක් මගින් දිවයින පුරා පොත් අලෙවි කිරීම ආරම්භ කෙරිණ.

2011 වර්ෂයේ පොත් විකිණීමෙන් ලැබූ මුළු ආදායම රු.61,231,133.56කි.

- ඉසුරුපාය පොත් වෙළඳ සැල රු. 6,142,821.80
- ඕල්කට් මාවත පොත් වෙළඳ සැල රු.44,423,607.95
- යාපනය පොත් වෙළඳ සැල රු. 1,164,736.97

- ජාතික අධ්‍යාපන ආයතනය මහරගම පොත් වෙළඳ සැල රු. 6,344,272.84
- මීපේ පොත් වෙළඳ සැල රු. 1,660,836.00
- කොටුව දුම්රිය ස්ථාන පොත් වෙළඳ සැල රු. 1,494,858.00

2011.02.04 දින සිට 2011.02.10 දක්වා පැවැත්වුණු "දැයට කිරුළ" ජාතික මහා ප්‍රදර්ශනයට සහ 2011.09.17 සිට 2011.09.25 දක්වා කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සහභාගි වීම මගින් දිවයිනේ විවිධ ප්‍රදේශවලින් පැමිණි පාසල් සිසුන් ඇතුළු විශාල පිරිසකට දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන ලබා ගැනීමට අවස්ථාව උදා කෙරිණි.

2011 මූල්‍ය කාර්ය ඵල වාර්තාව

ඇයවැය විස්තරය	2011 වාර්ෂික ප්‍රතිපාදන	2011.12.31 දිනට වියදම
වැය ශීර්ෂගත වියදම		
පුද්ගල පඩි නඩි	24,097,860.00	18,722,828.00
වෙනත් පුනරාවර්තන වියදම්	2,288,140.00	2,228,516.00
මුළු පුනරාවර්තන වියදම්	**26,386,000.00**	**20,951,344.00**
මූලධන වියදම්		
මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම	155,000.00	152,630.00
මුලධන වියදම් අත්පත් කර ගැනීම		
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	700,000.00	536,616.00
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	1,000,000.00	953,782.00
ගොඩනැගිලි	37,500,000.00	747,155.00
හැකියා වර්ධනය	2,500,000.00	2,392,550.00
එකතුව	**41,855,000.00**	**4,782,733.00**
අනෙකුත් මූලධන වියදම්		
පාසල් පෙළපොත්වල ගුණාත්මක භාවය වැඩි කිරීම	50,500,000.00	8,537,169.00
අනුමත අත්තිකාරම් ගිණුම		
උපරිම හර සීමාව (පෙළපොත් මුද්‍රණය හා බෙදහැරීම)	2,900,000,000.00	2,329,474,138.87
අවම බැර සීමාව	2,900,000,000.00	2,357,376,210.95
උපරිම හර ශේෂ සීමාව	4,000,000,000.00	1,025,087,310.19
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම		
උපරිම හර සීමාව	6,280,000.00	8,202,530.50
අවම බැර සීමාව	3,600,000.00	7,042,591.50
උපරිම හර ශේෂ සීමාව	28,000,000.00	21,339,197.36

2011 ප්‍රගතිය නිරූපණය කරන දර්ශක

2011 වර්ෂයේ දී නිෂ්පාදනය කරන ලද පෙළපොත් මාධ්‍ය අනුව බෙදී ඇති ආකාරය දැක්වෙන සටහනක් පහත දැක්වේ.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් 2011 පාසල් වර්ෂය සඳහා පළකරන ලද පාසල් පෙළපොත් (මාධ්‍යය අනුව)		
අනු අංකය	**මාධ්‍යය**	**පොත් වර්ග සංඛ්‍යාව**
1	සිංහල මාධ්‍ය පොත්	159
2	දෙමළ මාධ්‍ය පොත්	158
3	ඉංග්‍රීසි මාධ්‍ය පොත්	55
4	ඉංග්‍රීසි භාෂා පොත් (සියලු මාධ්‍ය සඳහා)	26
5	පිරිවෙන් සිංහල මාධ්‍ය පොත්	31
6	පිරිවෙන් ඉංග්‍රීසි භාෂා පොත්	04
7	පිරිවෙන් දෙමළ	05
	මුළු පොත් සංඛ්‍යාව	**437**

2011 වර්ෂයේ දී උසස් පෙළ සඳහා සම්පාදිත නව අතිරේක පොත්

පොතේ නම	**ප්‍රගතිය**
පුරාතන ගද්‍ය සංග්‍රහය	මුද්‍රණය කර අවසන්
ගිරා සංදේශය	මුද්‍රණයට සූදානම් කර ඇත
කෙටිකතා සංග්‍රහය	මුද්‍රණයට සූදානම් කර ඇත
උසස් පෙළ භෞතික භූගෝල විද්‍යාව I	සංස්කරණය කරමින් පවතී
නූතන පද්‍ය සංග්‍රහය	මුද්‍රණයට සූදානම් කර ඇත
ආර්ථික වර්ධනය හා සංවර්ධනය	මුද්‍රණය කර අවසන්
උසස් පෙළ ගිණුම්කරණය • නව ගිණුම්කරණ ප්‍රවේශ • සමාගම් ගිණුම්කරණය • අනුමත විශ්ලේෂණය	මුද්‍රණය කර අවසන්

2012 වර්ෂය වෙනුවෙන් 2011 වර්ෂයේ දී එක් එක් ශ්‍රේණි සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශනය කරන ලද පොත් ගණන හා එක සිසුවෙකුට ලැබෙන පොත් ගණන

ශ්‍රේණිය	පොත් ගණන (භාෂා, ආගම්, වෛකල්පිත විෂයයන් අනුව)			එක සිසුවෙකුට ලැබෙන පොත් ගණන
	තනි පොත් වශයෙන්	කාණ්ඩ වශයෙන්	එකතුව	
1ශ්‍රේණිය	14	0	14	4
2ශ්‍රේණිය	14	0	14	4
3ශ්‍රේණිය	12	6	18	8
4ශ්‍රේණිය	13	2	15	6
5ශ්‍රේණිය	13	2	15	6
6ශ්‍රේණිය	28	10	38	14
7ශ්‍රේණිය	17	32	49	20
8ශ්‍රේණිය	13	40	53	21
9ශ්‍රේණිය	23	20	43	16
10ශ්‍රේණිය	49	19	68	15
11ශ්‍රේණිය	37	32	69	15
12ශ්‍රේණිය	1	0	1	1
පාසල් පොත් එකතුව	**234**	**163**	**397**	
පිරිවෙන්1	7	0	7	7
පිරිවෙන්2	6	0	6	6
පිරිවෙන්3	9	0	9	9
පිරිවෙන්4	9	0	9	9
පිරිවෙන්5	9	0	9	9
පිරිවෙන් පොත් එකතුව	40	0	40	
මුළු එකතුව	**274**	**163**	**437**	

2012 වර්ෂය වෙනුවෙන් එක් එක් ශ්‍රේණි සඳහා ප්‍රකාශනය කරන ලද පොත් ගණන



2012 වර්ෂය සඳහා පාසල් පෙළපොත් මුද්‍රණය 2011

අනු අංකය	මුද්‍රණාලය	පොත් ප්‍රථම ගණන	පිටපත් ගණන
01	රජයේ මුද්‍රණාලය	05	905,000
02	රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව	81	7,400,900
03	විවෘත ටෙන්ඩරය	308	26,041,450
මුද්‍රණය කළ පොත්වල එකතුව		394	**34,347,350**

2012 වර්ෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය 2011

අනු අංකය	පොත් වර්ගය	පොත් ප්‍රථම ගණන
01	611 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ	06
02	12 13 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ	46
මුද්‍රණය කළ පොත් වර්ගවල එකතුව		**52**

2012 වර්ෂය සඳහා ප්‍රශ්නෝත්තර පොත් හා අතිරේක පොත් මුද්‍රණය 2011

අනු අංකය	පොත් වර්ගය	පොත් ප්‍රථම ගණන	සිටපත් ගණන
01	අතිරේක පොත්	06	95,000
02	ප්‍රශ්නෝත්තර පොත්	21	354,000
මුද්‍රණය කළ පොත් වර්ගවල එකතුව			**449,000**

2012 වර්ෂය සඳහා පාසල් පෙළපොත් බෙදහැරීම 2011

අනු අංකය	පළාත	පොත් ඉල්ලුම් ප්‍රමාණය	පොත් බෙදහැරීම් ප්‍රමාණය	බෙදහැරීම් ප්‍රමාණය ඉල්ලුමේ ප්‍රතිශතයක් ලෙස
1	බස්නාහිර	9,191,229	9,191,229	100.00
2	දකුණ	4,580,698	4,580,698	100.00
3	මධ්‍යම	4,536,826	4,536,826	100.00
4	වයඹ	4,107,822	4,107,822	100.00
5	නැගෙනහිර	4,009,792	4,009,792	100.00
6	සබරගමුව	3,200,374	3,200,374	100.00
7	ඌව	2,668,575	2,668,575	100.00
8	උතුර	2,537,587	2,537,587	100.00
9	උතුරු මැද	2,415,760	2,415,760	100.00
	එකතුව	**37,248,663**	**37,248,663**	**100.00**



නව පිවිසුම්

බාහිර ලේඛකයින්ගේ පොත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානවල අලෙවි කිරීම

බාහිර ලේඛකයින් හා ප්‍රකාශකයින් විසින් ප්‍රකාශනයට පත්කරන අධ්‍යාපනයට සම්බන්ධ පොත්, විද්වත් මණ්ඩලයක අනුමැතියකින් පසුව රජයේ මූල්‍ය රෙගුලාසිවලට එකඟ ව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පොත් අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානවල අලෙවියට කටයුතු සැලැස්වීම මගින් අදාළ ලේඛකයින්ට තම පොත් අලෙවි කර ගැනීමට අවස්ථාව ලැබෙන අතර පාඨකයින්ට ගුණාත්මක පොතක් මිල දී ගැනීමට අවස්ථාව සැලසේ.

පොත් අලෙවි ජංගම රථ

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන අතිරේක කියවීම් පොත්, විෂයානුබද්ධ පොත්, ප්‍රශ්නෝත්තර පොත්, නිර්දිෂ්ට ග්‍රන්ථ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ අලෙවි කිරීම සඳහා ජංගම රථ 02ක් දිවයින පුරා පාසල්වලට යොමු කිරීමට කටයුතු සැලසුම් කර ඇත. මේ මගින් දුෂ්කර ප්‍රදේශවල සිසුනට අවශ්‍ය පොත් සහන මිලකට ලබා ගැනීමට අවස්ථාව සැලසේ.

උසස් පෙළ සඳහා නව අතිරේක පොත්

උසස් පෙළ නව විෂය නිර්දේශයට සමගාමී ව විෂයානුබද්ධ අතිරේක පොත් රැසක් ප්‍රකාශනයට පත් කිරීමට කටයුතු කර ඇත.

සාරාංශය

2011 වර්ෂයේ අපේක්ෂිත අරමුණු හා ප්‍රගතිය

1. **2012 වර්ෂය සඳහා පාසල් සිසුන්ට අවශ්‍ය පෙළපොත් නිෂ්පාදනය කිරීම**

   2012 වර්ෂයේ පාසල් සිසුන්ට අවශ්‍ය සියලු ම පෙළපොත් නියමිත කාල සීමාව තුළ දී නිෂ්පාදනය කර අවසන් කොට ඇත

2. **ජාතික අධ්‍යාපන ආයතනය මගින් සකස් කරන ලද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණය කිරීම**

   ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කර එවන ලද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මුද්‍රණ කටයුතු සාර්ථක ව සිදු කර ඇත.

3. **2012 වර්ෂය සඳහා නැවත මුද්‍රණය කරන පෙළපොත්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීම**

   2012 වර්ෂයේ පාසල් සිසුන්ට බෙදාහැරීමට නියමිත පෙළපොත්, නැවත මුද්‍රණයට පෙර විද්වත් මණ්ඩලවල සහභාගිත්වයෙන් විෂය කරුණු යාවත්කාලීන කිරීම හා ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ කටයුතු සාර්ථක ව නිම කර ඇත.

4. **උසස් පෙළ හා වෙනත් විභාග සඳහා අතිරේක පොත්, ප්‍රශ්නෝත්තර පොත් නිෂ්පාදනය කිරීම**

   විද්වත් මණ්ඩලවල සහභාගිත්වයෙන් අතිරේක පොත් රැසක් සම්පාදනය කර ඇති අතර ඒවා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානවල හා ලියාපදිංචි පොත් වෙළඳ සැල්වල සහන මිලකට අලෙවියට යොදා ඇත. 2011 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගය, සාමාන්‍ය පෙළ විභාගය හා උසස් පෙළ විභාග ප්‍රශ්නපත්‍ර හා පිළිතුරු මාධ්‍ය දෙකෙන්ම ප්‍රශ්නෝත්තර පොත් වශයෙන් සකස් කර සහන මිලට අලෙවිය සඳහා යොමු කර ඇත.

5. **2012 වර්ෂය සඳහා සිසුන්ට අවශ්‍ය පෙළපොත් පාසල් හා බෙදාහැරීම් මධ්‍යස්ථානවලට බෙදහැරීම**

පාසල් හා බෙදහැරීමේ මධ්‍යස්ථාන මගින් ඉල්ලුම් කරන ලද සියලු පෙළපොත් 2011 වර්ෂය අවසානවීමට පෙර අදාළ මධ්‍යස්ථානවලට හා පාසල්වලට බෙදා නිම කර ඇත.

6. **ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ බෙදහැරීම**

මුද්‍රණය කරන ලද සියලුම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ගුරුවරුන්ට ලැබෙන පරිදි පාසල්වලට හා බෙදහැරීමේ මධ්‍යස්ථානවලට යොමු කර ඇත.

7. **නැවත භාවිතය දිරිමත් කිරීම**

පෙළපොත් නැවත භාවිතය දිරිමත් කිරීම සඳහා සහතික පත්‍ර ලබා දීම හා පාසල් සිසුන් දැනුවත් කිරීම සිදු කළ අතර එමගින් පෙළපොත් නාස්තිය අවම කර ගැනීමට හැකි විය.

8. **මානව සම්පත් සංවර්ධන කටයුතු**

අවස්ථා 02ක දී ලබා දුන් විදේශ පුහුණු මගින් නිලධාරීන් 21ක් පුහුණු කිරීමට කටයුතු යොදා ඇති අතර, එමගින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ නැංවීමට කටයුතු යොදා ඇත.

9. **පිටිපන ගබඩා සංකීර්ණයේ දෙවන අදියර නිම කිරීම**
(Phase - C (A සහ D Block)

2010.10.20 දින මෙම ගබඩා සංකීර්ණය ඉදිකිරීම ඇරඹුනු අතර 2011.06.10 දින එය නිම කිරීමට නියමිත විය. නමුත් මෙහි ඉදිකිරීම් ආරම්භ කර සිදුකරගෙන යාමේ දී කොන්ත්‍රාත්කරු විසින් පස් පිටතට ගෙන යෑමේ දී පැනනැගුණු ගැටලුවක් මත ඔහු අධිකරණ ක්‍රියාවලියකට මැදි වූ බැවින් අධිකරණ කටයුතු අවසන් වන තෙක් මාස 06කට ආසන්න කාලයක් ඉදිකිරීම් නතර වී තිබිණි. අධිකරණ කටයුතු අවසන් වීමෙන් පසු නැවත වැඩ ආරම්භ කරන ලද්දේ 2011.05.16 දිනයි. මේ නිසා 2011.06.10 වන විට මෙම ඉදිකිරීම් නිම කිරීමට නොහැකි විය. 2011.05.16 දින සිට මෙය ක්‍රියාත්මක වන අතර 2011 වර්ෂය අවසාන වන විට බිම් මහලේ ඉහළ ස්තරය (Slab) නිම කර තිබිණි.

10 ශ්‍රේණිය

පාසල් පෙළපොත් හොඳින් පරිහරණය කිරීමේ වැඩසටහන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන අමාත්‍යාංශය

2011



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින්
නොමිලේ ලබා දෙන පෙළපොත් ඉතා හොඳින් පරිහරණය කිරීමෙන්
ජාතික ධනය සුරැකීමේ කරන ලද දායකත්වය වෙනුවෙන්

..... විදුහලේ ..... ශ්‍රේණියේ

..... ශිෂ්‍යයා/ශිෂ්‍යාව වෙත

මෙම සහතිකය ප්‍රදානය කරන ලදී.

.....	.....	.....
විදුහල්පති	ඩබ්.එම්.එන්.පේ. පුෂ්පකුමාර අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්	එච්.එම්. ගුණසේකර ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ඉසුරුපාය, බත්තරමුල්ල
2011. 12. 09

பாடசாலைப் பாடநூல்களைச் சிறப்பாகப் பயன்படுத்தும் வேலைத்திட்டம்
கல்வி வெளியீட்டுத் திணைக்களம்
கல்வி அமைச்சு
2011



இலங்கை சனநாயகச் சோசலிசக் குடியரசினால் இலவசமாக வழங்கப்படும் பாடநூல்களை மிகச் சிறப்பாகப் பயன்படுத்தியதன் மூலம் தேசிய சொத்தைப் பாதுகாப்பதில் பங்களித்தமைக்காக

..... பாடசாலையில் ..... தரத்தில்

கல்வி கற்கும்..... எனும்

மாணவனுக்கு / மாணவிக்கு இச்சான்றிதழ் வழங்கப்படுகின்றது.

.....
அதிபர்

.....
டபிள்யூ.எம்.என்.ஜே.புஷ்பகுமார
கல்வி வெளியீட்டு ஆணையாளர் நாயகம்

.....
எச்.எம்.குணசேகர
செயலாளர்
கல்வி அமைச்சு

கல்வி வெளியீட்டுத் திணைக்களம், இசுருபாய, பத்தரமுல்ல
2011. 12. 09

ඇමුණුම 03

කේත අංකය :
குறியீட்டு இல :

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා
அலுவலக உபயோகத்திற்காக

EPD/2012/01

පෙළපොත් ඇණවුම් ලේඛනය
பாடநூல் கோரல் படிவம்

2012

සෘජු බෙදා හැරීම්
நேரடி விநியோகம்

පළාත :.....
மாகாணம்

කලාපය :.....
வலயம்

ජාතික පාසල/සිසුන් 2000 ට වැඩි පාසල

தேசிய பாடசாலைகள் / மாணவர்கள் 2000ஐ விட கூடிய பாடசாலைகள்/:

.....

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
கல்வி வெளியீட்டுத் திணைக்களம்

ඇමුණුම 04

කේත අංකය :
குறியீட்டு இல. :

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා
அலுவலக உபயோகத்திற்காக

EPD/2012/02

පෙළපොත් ඇණවුම් ලේඛනය

பாடநூல் கோரல் படிவம்

මධ්‍යස්ථානය හරහා පෙළපොත් බෙදා හරින පාසල්

மத்திய நிலையங்களினூடாக பாடநூல் விநியோகிக்கப்படும் பாடசாலைகள்

2012

පළාත :.....
மாகாணம்

කලාපය :.....
வலயம்

කොට්ඨාසය :.....
கோட்டம்

මධ්‍යස්ථානය :.....
மத்திய நிலையம்

පාසල :.....
பாடசாலை

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
கல்வி வெளியீட்டுத் திணைக்களம்

කේත අංකය :
குறியீட்டு இல. :

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
அலுவலக உபயோகத்திற்காக



EPD/2012/03

මධ්‍යස්ථාන පෙළපොත් ඇණවුම් ලේඛනය
மத்திய நிலைய பாடநூல் கோரல் படிவம்

2012

පළාත
மாகாணம் :.....

කලාපය
வலயம் :.....

කොට්ඨාසය
கோட்டம் :.....

මධ්‍යස්ථානය
மத்திய நிலையம் :.....

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
கல்வி வெளியீட்டுத் திணைக்களம்